# ප්‍රධාන ලේකම් කාර්යාලය - වයඹ පළාත
பிரதான செயலாளர் அலுவலகம் - வடமேல் மாகாணம்
Chief Secretary's Office – North Western Province

පළාත් සභා කාර්යාල සංකීර්ණය, කුරුණෑගල - மாகாண சபை அலுவலகத் தொகுதி, குருநாகல் - Provincial Council Office Complex, Kurunegala.

මූල්‍ය කළමනාකරණ අංශය
நிதி முகாமைத்துவ பிரிவு
Financial Management Division


| | | | | | |
|---|---|---|---|---|---|
| මගේ අංකය<br>எனது இலக்கம்<br>My No | NWP/CS/B01/Bud/2025 | ඔබේ අංකය<br>உமது இலக்கம்<br>Your No | | දිනය<br>திகதி<br>Date | 2025.04. 30 |

පළාත් භාණ්ඩාගාර (අයවැය) චක්‍රලේඛ 01/2025 (i)

වයඹ ආණ්ඩුකාරවර ලේකම්,

වයඹ පළාත් සභා ලේකම්,

වයඹ පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම්,

වයඹ පළාතේ සියළුම අමාත්‍යාංශ ලේකම්වරුන් හා

පළාත් දෙපාර්තමේන්තු ප්‍රධානීන් වෙත,

## <u>වියදම් දැරීම සඳහා බලය දීම - 2025 වර්ෂය</u>

2025 වර්ෂය ආරම්භයේදී විසර්ජන පනත සම්මත වී නොතිබූ බැවින් විසර්ජන පනත සම්මත වන තුරු 2025.01.01 දින සිට 2025.04.30 දින දක්වා කාලය තුල වියදම් දැරීම සඳහා අතුරු සම්මත ගිණුම - 2025 මගින් පාර්ලිමේන්තුවේ අනුමැතිය ලබා ගන්නා ලදි.

02. ඒ අනුව මුදල් කොමිෂන් සභාව විසින් වයඹ පළාත් සභාව වෙත වෙන් කරන ලද මූල්‍ය ප්‍රතිපාදන පදනම් කර ගෙන 1990 අංක 28 දරණ පළාත් සභා සංශෝධන පනතින් සංශෝධිත 1987 අංක 42 දරණ පළාත් සභා පනතේ 27 අ වගන්තිය පරිදි වයඹ පළාත් ගරු ආණ්ඩුකාරවර වෙත පැවරෙන බලතල ප්‍රකාරව 2025.01.01 දින සිට 2025.04.30 දින දක්වා කාලය තුල වයඹ පළාත් සභාවට අදාල වැය දැරීම සඳහා 2024 අංක 01 දරණ විසර්ජන නියෝගය මගින් බලය ලබාදෙන ලදි.

03. 2025 වර්ෂයේ අතුරු සම්මත ගිණුමේ ඇතුලත් වූ ප්‍රතිපාදනද ආවරණය වන පරිදි 2025 වර්ෂය සඳහා වන විසර්ජන පනත 2025.03.21 දින පාර්ලිමේන්තුවේ සම්මත කර ඇති බැවින් ඒ අනුව මුදල් කොමිෂන් සභාව විසින් 2025 සමස්ථ වර්ෂයේ වියදම් දැරීම සඳහා වයඹ පළාත් සභාව වෙත වෙන් කරන ලද මූල්‍ය ප්‍රතිපාදන පදනම කරගෙන 1990 අංක 28 දරණ පළාත් සභා (සංශෝධිත) පනතින් සංශෝධිත 1987 අංක 42 දරණ පළාත් සභා පනතේ 27 අ වගන්තිය පරිදි වයඹ පළාත් ගරු ආණ්ඩුකාරවර වෙත පැවරෙන බලතල ප්‍රකාරව 2025.01.01 දිනෙන් ආරම්භ වී 2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වන මුදල් වර්ෂයේ වයඹ පළාත් සභාවේ වැය දැරීම සඳහා මූල්‍ය ප්‍රතිපාදන ඇතුලත් 2025 අංක 01 දරණ විසර්ජන නියෝගය හා අදාල අධිකාරී බලපත්‍ර අත්සන් කරනු ලැබ ඇත. ඒ අනුව 2025 වර්ෂය සඳහා වූ වාර්ෂික මුදල් ප්‍රකාශයේ මෘදු පිටපත www.cs.nw.gov.lk වෙබ් අඩවියෙන් බාගත කර ගන්නා ලෙස දන්වමි. එහි සඳහන් මූල්‍ය ප්‍රතිපාදන සීමාවන් හා නියමයන් නොඉක්මවා වියදම් දැරීම සඳහා ගණන් දීමේ නිළධාරීන් වෙත මෙයින් බලය දෙමි.


ප්‍රධාන ලේකම් / பிரதம செயலாளர் / Chief Secretary — Tel 037-2228019, Fax 037-2223777, e-mail chiefsecretary@nw.gov.lk

ප්‍රධාන ලේකම් කාර්යාලය / பிரதம செயலாளர் அலுவலகம் / Chief Secretary's Office — Tel 037-2231769-72, Fax 037-2222234, e-mai csnwp@sltnet.lk, Web site : www.cs.nw.gov.lk

නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (මූල්‍ය කළමනාකරණ) / பிரதி பிரதம செயலாளர் (நிதி முகாமைத்துவம்) / Deputy Chief Secretary (Financial Managment) — Tel 037-2223731, Fax 037-2228128, e-mail dcafnnwpc@yahoo.com


CamScanner

04. වාර්ෂික මුදල් ප්‍රකාශයේ II උපලේඛණයේ අත්තිකාරම් ගිණුම් කටයුතු වල සීමාවන් දක්වා ඇත. වැය ශීර්ෂ යටතේ වියදම් දැරීම සඳහා අවශ්‍ය ප්‍රතිපාදනයන් රජයෙන් ලැබෙන නමුත්, අත්තිකාරම් ගිණුම් කටයුතු සඳහා එවැනි මුදලක් නොලැබේ. එබැවින් අත්තිකාරම් ගිණුම් පවත්වා ගෙන යායුතු වන්නේ එම අත්තිකාරම් ගිණුම් වලට ලැබෙන මුදල් පදනම් කර ගෙනය. ඒ අනුව, පළාත් රාජ්‍ය නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම් යටතේ ගෙවීම් කළ යුතු වනුයේ වාරික වශයෙන් අයකර ගනු ලබන මුදල් උපයෝගී කර ගනිමින් එම ප්‍රමාණය දක්වා පමණි.

05. අතුරු සම්මත ගිණුම අහෝසි වීම හා විසර්ජන නියෝගය බලාත්මක වීම

2024.12.24 දින වයඹ පළාත් ගරු ආණ්ඩුකාරතුමා විසින් සම්මත කරන ලද අතුරු සම්මත ගිණුම මගින් ඒ ඒ වැය ශීර්ෂ යටතේ වෙන්කර තිබුණු ප්‍රතිපාදන ඇතුලත් කරමින් 2025 අංක 01 දරන විසර්ජන නියෝගය සකස් කර ඇත. ඒ අනුව 2025 සම්පූර්ණ මුදල් වර්ෂය තුල අයවැය අස්ථීත්වයන් මගින් දරනු ලබන වියදම් මෙම නියෝගයේ විධිවිධාන පරිදි විය යුතු වේ.

ඒ අනුව, අත්තිකාරම් ගිණුම් කටයුතු යටතේ දරනු ලබන වියදම් හා අතිරේක ප්‍රතිපාදනද ඇතුලත්ව අතුරු සම්මත ගිණුම යටතේ 2025.01.01 දින සිට මේ දක්වා දරන ලද සියලු වියදම් 2025 අංක 01 දරන විසර්ජන නියෝගය යටතේ දරන ලද වියදම් ලෙස සැලකිය යුතු වේ.

එසේම 2025.01.01 දින සිට 2025.04.30 දින දක්වා නිකුත් කරන ලද බල අංක යටතේ වන අතිරේක ප්‍රතිපාදනද, 2025 අංක 01 දරන විසර්ජන නියෝගයෙන් ලබාදුන් අතිරේක ප්‍රතිපාදන ලෙස සලකනු ලැබේ. 2025 වර්ෂයේ වාර්ෂික අයවැය ඇස්තමේන්තු සකස් කිරීමේදී ඇතැම් අතිරේක ප්‍රතිපාදන නිකුත් කිරීමද ඇතුලත් කර වාර්ෂික වියදම් සීමාවන් නිර්ණය කර ඇති අවස්ථා වලදී පළාත් භාණ්ඩාගාරය විසින් පෙර නිකුත් කරන ලද අතිරේක ප්‍රතිපාදන ලිපි අවලංගු කිරීමට කටයුතු කරනු ඇත. එවන් අවස්ථාවලදී අතිරේක ප්‍රතිපාදන භාවිත කරමින් දරන ලද වියදම් 2025 වාර්ෂික ඇස්තමේන්තු මගින් වෙන්කරන ලද ප්‍රතිපාදන යොදාගනිමින් දරන ලද වියදමක් සේ සලකනු ඇත.

තවද, 2024.12.24 දින සම්මත කරන ලද අතුරු සම්මත ගිණුම මගින් සලසන ලද ප්‍රතිපාදන වල යම් ඉතිරියක් වේ නම් එය තව දුරටත් වලංගු නොවනු ඇත.

06. මෙම චක්‍රලේඛයේ සඳහන් වෙනස් කිරීම් හැර, වියදම් දැරීම සඳහා බලය දීමට අදාලව මා විසින් නිකුත් කරන ලද 2025.01.01 දිනැති පළාත් භාණ්ඩාගාර (අයවැය) චක්‍රලේඛ 01/2025 හි සඳහන් නියමයන්ට අනුකූලව සියලු ප්‍රධාන ගණන් දීමේ හා ගණන් දීමේ නිලධාරීන් කටයුතු කළ යුතුය.

අයි.එම්.අයි.ඉලංකෝන්,
ප්‍රධාන ලේකම්,
වයඹ පළාත.

| | | | |
|---|---|---|---|
| පිටපත් : | 1. විගණකාධිපති | - | දැ.පි |
| | 2.අධ්‍යක්ෂ(ගිණුම් හා ගෙවීම්) | - | දැ.පි හා අ.කා.ස. |
| | 3.අධ්‍යක්ෂ(මුදල් හා ආදායම්) | - | දැ.පි හා අ.කා.ස. |



CamScanner